1 වන පිටුවෙන්.....
මේ ගමනේ ප්‍රාතිහාර්ය නැත !

අතරේ එයට බාධාවන අයුරින් එදා ඒ හැසිරුණු ආකාරයයි. එසේ වීමට මූලික හේතුව නම් රටේ නායකයා සහ ශ්‍රීලනිපයේ පක්ෂ නායකයා හැටියට ජනාධිපතිවරයා සහ ඔහුගේ රජයෙන් ක්‍රියාත්මක වන නීතිය ඔහුගේම යටතේ සිටින මන්ත්‍රීවරුන්ගේ ඉහතකී නොමනා හැසිරීම් හමුවේ ඒවා ඉතා සුළු දේවල් ලෙස සිතා අහක බලාගෙන ඉවසා සිටීමේ දුර්වලකමයි. ඔවුන් එදා හැසිරුණේ මන්ත්‍රීවරුන්ට වඩා ඇප්සනිස් ඨානය වැනි නීතිය බිඳවැටුණු රටවල සටන් බිම්වල සිටින තුවක්කුව හිසවට කර කවන කැරළිකාර චණ්ඩීන්ගේ ස්වරූපයෙනි.

දැන් මොවිහු ජනාධිපතිවරයා ඉදිරියේම ඔහු රටේ වැදගත්ම ස්ථානයේ සිට, රටට අදාළ වැදගත් කතාවක් ඉදිරිපත් කරද්දී නීතිය තඹයකට නොසලකා හැසිරී නීතිය කඩාබිඳ දැම්මෝය. මේ විදියට මොවුන් ඉදිරියට ජනාධිපතිවරයාට එරෙහිව ද අතක් උස්සන්නට ලෑස්තිවුවහොත් අප පුදුම විය යුතු නොවේ. මෙයට කලින් රජයට පාර්ලිමේන්තුවේ බලය අඩුව තිබෙමින් පිහි තුඩ මත දෝලනය වන්නාක් මෙන් ස්ථාවර තත්වයක් නැතිව සිටි බව අපට මතකය. දැන් එසේ නොවේ. දැන් රජයට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා බලයක් ඇත. එසේ නම් මේ කුණු ගොඩවල් ඉවතට විසිකරනු මිසක තවත් තබාගත යුතු නොවේ. මේ සිදුවීම් හමුවේ ලංකාවේ සියළු ජනතාව වෙනුවෙන් අප ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ අප්‍රසන්න නොහික්මුණු දාමරික මන්ත්‍රීවරුන් කීපදෙනා ඔවුන් පත්කළ ජනතාවට අවමානයක් ලැජ්ජාවක් නොවනු පිණිස වහා ඉවත්කර දමන ලෙසටය. කොටි ත්‍රස්තවාදයේ සිටි දහස් ගණනක් තරුණ තරුණියන් පුනරුත්ථාපනය කරන වර්තමාන රාජ්‍ය නායකයාට මේ කාර්‍යය ඉතා සුළු දෙයක් වන බව අපට විශ්වාස ය.

අය වැය

තවමත් පාර්ලිමේන්තුවේ අය වැය විවාදය කෙරෙමින් පවතින බැවින් නිශ්චිත තීරණයක් ඒ ගැන දැන්ම දිය නොහැකිය. එහෙත් මේ මූලික අවස්ථාවේදී දැනට පෙනෙන කරුණු කීපයක් ගැන සඳහන් කළ හැකිය.

මූලික වශයෙන් 2012, මැතිවරණ හෝ ඡන්ද වලින් තොර වසරක් බැවින් රජයට ආසන දිනන්නටය කියා පීඩනයක් නැත. ඒ නිසා කඩිනම් සමාජ සුබසාධන පියවර වල් ගන්නට අවශ්‍යතාවක් නොවේ. එහෙත් ඒවා ක්‍රමයෙන් සිදුවිය යුතු දේවල් බවට සැක නැත. කෙසේ වුවද පුරුද්දට මෙන් ඡන්දදායක සහයෝගය තමන් වෙතට නම්මවා තබාගැන්මේ අදහසින් රජය අය වැයෙන් විශ්‍රාම වැටුප් සහ රණවිරු පවුල් වල දීමනා වැඩිකර ඇති බව පැහැදිලිය.

වැදගත් දෙයක් හැටියට සැලකිය හැක්කේ 1977 දී ආරම්භව මේ තාක් අප රටේ බලපවත්වන විවෘත ආර්ථිකය වෙතින් ඉවතට යාමේ අදහසින් රජය ගෙන ඇති සංවර්ධන ව්‍යාපාරයන් ය. මෙය රජයේ ප්‍රකාශිත මහින්ද චින්තනයේ ද යායුතු මග ලෙස අවධාරණය කර ඇති කටයුත්තකි.

අනෙක් වැදගත් කරුණ නම් රජය දැනට ගෙවන්නට ඇති රාජ්‍ය ණය ප්‍රමාණය ගැන අවධාරණයෙන් සිටීමයි. 2005 වසරේදී රුපියල් බිලියන 2500 ක් වූ එය, දැන් තවත් 250 ක් එකතු වෙමින් බිලියන 5500 දක්වා දෙගුණ වී ඇත. එසේම වෙළඳ හිඟය (trade deficit) බිලියන 250 සිට බිලියන 585 දක්වා වැඩිවී තිබේ. මේවා පියවා ගැන්මට සංවර්ධන අංශයෙන් මහත් පරිශ්‍රමයක් දරන්නට සිදුවන අතර, මුදල් පරිහරණයේදී ඉතා පරිස්මෙන් ක්‍රමවත්ව කටයුතු කරන්නට ලංකාවට සිදුව ඇත. අය වැය පවසන්නේ රජය වර්ධනය 8% ක තබමින් උද්ධමනය 5% තබා පාලනය කරන බවය. එසේම සංචාරක ව්‍යාපාරය සහ දළ භාණ්ඩ වලට වඩා නිමි භාණ්ඩ අපනයනය දියුණු කිරීමෙන් පෞද්ගලික අංශයේ ද ආර්ථික වර්ධනයක් රජය බලාපොරොත්තු වෙයි. 3% කින් ලංකා රුපියල අවප්‍රමාණය කිරීමද සහල් හා පොල් නිශ්පාදනය වර්ධනය කර ඒවා අපනයනය කිරීමට කටයුතු සැලැස් වීමද ඒ ආර්ථිකය නගා සිටුවීමේ ඉලක්ක යට රජය ගමන් කිරීමේ වැයමකි. ගව පට්ටි ඇතිකිරීම දියුණුකිරීමෙන් කිරිපිටි ආනයනය අඩු කිරීම තවත් පියවරකි. මේ සියල්ල

ජනාධිපතිවරයා ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ 2011 අය වැය ඉදිරිපත් කළ දා

අනුසාරයෙන් වෙළඳ ආර්ථික හිඟය (trade deficit) පියවා ගැන්ම රජයේ අදහස වෙයි.

පැහැදිලි දිසාවක් ඉලක්ක කර ඇති බව හැඟෙයි. එය විස්තරාත්මකව දක්නට හැකිවන්නේ අය වැය විවාදය සම්පූර්ණව පැවැත්වූවාට පසුවය. මේ සියලු කාරණා අප රටේ අභිවෘද්ධියට හේතු වෙනවා ඇතැයි අපේ බලාපොරොත්තුවයි.

වාර්තා දෙකක්

පසුගිය සති කීපය තුළ ශ්‍රීලංකාවේ අවධානයට යොමුවූ වාර්තා දෙකක් ඇත. ඒවා නම්:

1. NORAD නමැති නෝර්වේ සංවිධානයක් මගින් පිළියෙල කළ "Pawns of Peace-Evaluation of Norwegian Peace Efforts in Sri Lanka 1997-2009" (සාමයේ පඹයන් හෙවත් ඉත්තන් 1997-2009 ශ්‍රීලංකාව තුළ නෝර්වේ රජය ගත් සාම ප්‍රයත්නය අගැයීමක්)

2. The LLRC Report of the Special Commission appointed by the Sri Lankan Govt.to go into the recent events in the country and to make proposals for a unified future.(ශ්‍රීලංකා රජය විසින් පත් කළ උගත් පාඩම් කොමිසමේ වාර්තාව)

1. නෝර්වේ වාර්තාව වනාහි නෝර්වේ රජයේ අදහස් අනුව ලන්ඩන් විශ්වවිද්‍යාලයේ උපාධිධරයන් කීපදෙනෙකු විසින් පිළියෙල කරන ලද්දකි. එම වාර්තාව වචන වලින් බොහෝ කරුණු සඳහන්ව ඇතත් හරය අතින් ඉතා දුර්වලය. එය සැබැවින්ම එරික් සොල්හයිම් ප්‍රමුඛ නෝර්වේ රජයේ කණ්ඩායමක් තමන් උඩද බිමද නොදන්නා ආගන්තුක රටක් වූ ශ්‍රීලංකාවට වරින් වර යමින් කොටි සංවිධානය සහ ශ්‍රීලංකා රජය අතරේ සාමය ඇතිකරන මුවාවෙන් ඔස්ලෝ ඇතුළු බටහිර නගරවල ක්‍රියාත්මක වන කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරා සාමාජිකයින් පිනවීම පිණිස ගෙන ගිය කුට වැඩ පිළිවෙල පිළිබඳ අශෝභන කතාන්තරයයි.

නෝර්වේකාරයින්ට මොළය අවුන්සයක් හෝ තිබුණි නම් ඊට වසර දහයකට කලින් ලංකාවට සාමය ගෙනෙන්නට හැදූ ඉන්දියාවට සිදුවූ දෙය ගැන හිතන්නට තිබුණි. අවසානයේ ඒ නිසාම රජීව් ගාන්ධි මැරුම් කෑවේය. ප්‍රභාකරන් සමග සාමයක් බැරිබව ලංකාවේ සාමාන්‍ය ජනතාව ගමේ රටේ විදියට කල්පනා කොට තේරුම්ගෙන තිබිණ. එහෙත් එතරම් නුවණක් නැති යූ ඇන් පී නායක රනිල් වික්‍රමසිංහ පවා තමා තාවකාලිකව අගමැතිවූ අවස්ථාවේ කොටින් සමග අපකීර්තිමත් සටන් විරාම ගිවිසුමක් ද අත්සන් කළේය. ඉන් වාසි ලැබූ කොටි ඒ කාලය අතරතුර ආයුධ ගෙන්වා ගනිමින් තව තව ශක්තිමත් වූහ. අහස් යාත්‍රා කැලිඳ ගෙනැවිත් ගුවන් හමුදාවක් තනා ගත්තෝය. කොටි ඒ කාලයේත් බෝම්බ පිපිරවීම සහ හමුදා හටයින් ඝාතනය නැවැත්වූයේ ද නැත.

ලංකාවට සාමය ගැන නිරීක්ෂණය කරන්නටයයි පැමිණි නෝර්වීජියානුවන් හිතේ හැටියට උතුරු නැගණිහිර සංචාරය කරමින්, පාසිකුඩා ආදී මුහුදු තීරවල පිහිනමින් ප්‍රීතිමත් නිවාඩු ගත කළා මිසක උදා කළ සාමයක් නැත. එල්ටීටීඊයට අවශ්‍ය ගුවන් විදුලි උපකරණ සහ නවීන තාක්ෂණික භාණ්ඩ සියල්ලක්ම ලැබුණේ එම නෝර්වේ නිරීක්ෂකයින්ගෙනි.

කෙසේ වුවද ඉදිරියට විය හැකි අන්තරාය හොඳින් වටහා ගත් ශ්‍රී ලාංකික සාමාන්‍ය ජනතාව, විශේෂයෙන් ගම්බද ජනතාව අගමැති රනිල් පිටුදැක වෙනත් නායකත්වයක් තෝරා ගැන්ම නිසා සියල්ල නොසිතූ සුභදායක අන්දමින් කෙළවර විය. ඉතිරි සියල්ල ඉතිහාසයයි.

යම් හෙයකින් නෝර්වේ සාම වෙළඳාම හරිගියා නම් අප රටේ ඉදිරිය කුමක් වෙනවා ඇද්දැයි සිතා ගන්නට වත් බැරිය. එසේ නම් ප්‍රභාකරන් ද කොටි හමුදාව ද තවම නිරූපද්‍රිතව ඉන්නවා නිසැක ය.

ශ්‍රීලංකාවට පැමිණ ඒ රට විනාශකරන ත්‍රස්තවාදී සංවිධානයකට ආධාරකිරීම ගැන නෝර්වේ රාජ්‍යය සැබැවින්ම ශ්‍රීලංකාවෙන් සමාව අයැදිය යුතු ය.

උගත් පාඩම් කොමිසමේ වාර්තාව (LLRC Report)

ටික දිනකට පෙර ඉහතකී වාර්තාව එය පිළියෙළ කළ කමිටුව විසින් ලංකා ජනාධිපතිවරයාට බාරදෙන ලදී. එතුමා එය කියවා පාර්ලිමේන්තුවට ඉදිරි පත්කර ඉන්පසු එය රටේ ජනතාවටද පෙන්වා ඒ වාර්තාවෙන් නිර්දේශ කර ඇති පරිදි ක්‍රියාකරන බවට පොරොන්දු වී තිබේ.

මේ අතරේ බ්‍රිතාන්‍ය විදේශ ඇමති ඇලිස්ටෙයර් බර්ට් ලංකාවට දන්වා සිටියේ එම වාර්තාව වහා ක්‍රියාත්මක කොට විවිධ ජනකොටස් අතර සංහිඳියාව වහා ඇතිකරන ලෙසටය. මේ පිස්සු මිනිහා හිතනවා ඇත්තේ බ්‍රිතාන්‍යය කරන ආකාරයට ලංකාවද වාර්තා හමස් පෙට්ටියේ දමා නිහඬ වෙනවා කියා විය හැකිය.

ශ්‍රී ලංකාව ඔහුට පිළිතුරු දී ඇති අතර බ්‍රිතාන්‍ය ඒ කියූ පරිදි චිල්කොට් වාර්තාව ක්‍රියාත්මක කළේ දැයි අසා ඇත. කලක් තිස්සේ බ්‍රිතාන්‍යය සහ ඇමරිකාව ඉරාකයට චෝදනා කළේ එහි රසායනික ආයුධ තිබෙනවාය කියායි. ඒවා සොයන නියාවෙන් ඔව්හු ඉරාකයට පහරදී එහි ජනතාවද මරා රට විනාශකොට අවසානයේ සදාම් හුසේන්ද මරණ තැනට ගෙනාවෝය. එහෙත් ඉරාකයේ රසායනික ආයුධ කිසිවක් හමුවුණේ නැත. ඒ කතාව බොරුවක් වීය.

ජනතා උද්ඝෝෂණ නැග එන විට ඉරාක ආක්‍රමණය ගැන කරුණු සොයන්නට බ්‍රිතාන්‍යයම චිල්කොට් කොමිසම පත් කළාය. ඒ වාර්තාවෙන් රසායනික ආයුධ ඉරාකයේ නොතිබුණු බව ඔප්පුවුනා පමණක් නොව හිටපු අගමැති ටෝනි බ්ලෙයාර් යුද අපරාධකාරයෙක් බවටත් විදහා දැක්විණ. ඒ චිල්කොට් වාර්තාව තුළ රහස්‍ය කරුණු ඇති බව කියමින් බ්‍රිතාන්‍ය එය එළියට දැම්මේ නැත. දැන් ඔවුන් ලංකාවට ඇහිල්ල දිගු කරති.

අප රටේ සතුරන් තවම ක්‍රියාත්මකව සිටින බව අප අමතක නොකළ යුතුය. ඔවුන් යළිත් අපට පහර දෙන්නට සූදානමින් දැන් හෝ අනාගතයේ හෝ අවස්ථාවක් එනතුරු විමසිල්ලෙන් බලාගෙන සිටිති. දකුණේ අධිවේගී මාර්ගය මෙන් ඉදිරිය පැහැදිලිව බාධා නැතිව කඩාගෙන වේගයෙන් යා හැකි ගමනක් නොවේ මෙය. අධිවේගී මාර්ගයද බොහෝ පරිශ්‍රමයෙන් යුතුව වැඩකොට අපේ හිතවතුන්ගේ ද සහායෙන් තනාගත් මාවතකි. ප්‍රාතිහාර්යයන් ඇතිවී ඉබේම සියල්ල සම්පාදනය කර දෙනවා යයි සිතීම මෝඩකමකි. එම ප්‍රාතිහාර්ය මහන්සි වී වැඩකිරීමේ ප්‍රථිපල වෙති. අපේ ජනතාව ඒ අයුරින් ක්‍රියාකිරීමේ හොඳම ප්‍රථිපලය අත්වූයේ භයානක ත්‍රස්තවාදයක් රටෙන් සහමුලින්ම තුරන්කර දැමීමෙනි. ඒ අයුරින් දිරියෙන් යුතුව සියළු කටයුතු ඉදිරියට රැගෙන යන්නට අප අධිෂ්ඨාන කරගත යුතුය.

ඔබ සැමට සුබ නත්තලක් සහ සුබ නව වසරක් වේවා !

දේශපාලනය සහ ක්‍රීඩාව

ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරී
♦ මේජර් වී. බී. කරුණාරත්න විසිනි

ක්‍රීඩාව වනාහි චමත්කාරවූත්, අද්විතීය වූත්, ස්වාධීන වියයුතු වූත් තරඟකාරී ක්ෂෙත්‍රයකි. එනිසාම ක්‍රීඩා ක්ෂෙත්‍රය කිසි විටෙකත් දේශපාලනීකරණය හෝ ව්‍යාපාරීකරණය විය යුතු නොවේ. එමෙන්ම එය අනුචිත උපක්‍රම වලින්ද බැහැරවිය යුතුය. එහෙත් දැන් ලෝකයේ ක්‍රීඩාව සෑම මට්ටමකින්ම ඉහතකී ව්‍යසනයන්ට ගොදුරුවෙමින් පවතී. ශ්‍රීලංකාවේ තත්වය ද එසේම බව කිව හැකි ය.

කුමන දණ්ඩකින් මැන බැලුවත් අද ශ්‍රීලංකාවේ දැවැන්ත ක්‍රීඩාව ක්‍රිකට්ය. එහි පාලක මණ්ඩලයේ සභාපතිවරයා තෝරාගැන්මේ නිලවරණය නුදුරේදීම පැවැත්වීමට නියමිතය. මේ සඳහා දේශපාලනඥයන්ද, ව්‍යාපාරිකයන්ද, ගතේ හයියෙන් බලවතුන් වෙන (ගණන්කාරයෝ) පුද්ගලයන් ද දැනටමත් සටන් අරඹා ඇත.

1996 ලෝක ක්‍රිකට් ශූරතාව දිනූ ශ්‍රීලංකා ක්‍රිකට් නායක අර්ජුණ රණතුංග බ්‍රිතාන්‍යයේ ඔක්ස්ෆර්ඩ් සංගමයේදී ශ්‍රීලාංකිකයින් හමුවේ ප්‍රකාශකර සිටියේ ශ්‍රීලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයට දේශපාලකයින් පත්වීමෙන් සේවයක් සැලසුණු බවයි. එහෙත් ව්‍යාපාරිකයන් පත්වීමෙන් සිදුවූයේ හානියක් බවයි. ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා, ටිරෝන් ප්‍රනාන්දු, ලක්ෂමන් ජයකොඩි වැනි දේශපාලකයින් වෙතින් ක්‍රිකට් දියුණුවට දේශපාලන පිටුවහලක් ලද බව ද අර්ජුණ රණතුංග එදා එහිදී කියා සිටියේ ය.

2018 පොදුරාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල ශ්‍රීලංකාවේ හම්බන්තොටදී පවත්වන්නට කෙරුණු ඉල්ලීම බැලූ බැල්මට දේශපාලන තීරණයක් බව පෙනේ. එම ක්‍රීඩා උළෙල හම්බන්තොට පැවැත්වීමට තීරණය වූවේ නම් එමගින් ශ්‍රී ලංකාවේ අභිමානය හා ගෞරවය ඉහළ නැංවෙනු ඇත

ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවලට සත්කාරකත්වය ඉල්ලීමද අද ජාත්‍යන්තර සුදුවක්ව පවතී. ක්‍රීඩා සමුළුවල ජන්දය දිනා ගැනීමට විවිධ දොළපිදේනි, සත්කාර පමණක් නොව නම්බු නාම පවා පිදීමට සිදුව ඇත.

වසර 30 ක කාලයක් පුරා තිබූ ත්‍රස්තවාදී ක්‍රියා නිසා හෙම්බත්ව ආර්ථික හා සාමාජීය දර්ශකවල පල්ලමටම බැසයමින් තිබූ ශ්‍රීලංකාවට හිස එසවීමට අවස්ථාවක් ලැබෙනු ඇත. මහා බ්‍රිතාන්‍යය, නවසීලන්තය, ඔස්ට්‍රේලියාව, කැනඩාව, ඉන්දියාව, පකිස්ථානය ඇතුළු රටවල් 54 ටම ශ්‍රීලංකාව කියා සිටියේ කඩා වැටෙමින් තිබූ දේශය ගොඩනංවාගෙන ආසියාවේ ආශ්චර්‍යය වීමට අවස්ථාවක් සලසන ලෙසටය.

දේශපාලන වශයෙන් මේ ඉල්ලීම වැරදි නැත. නිරවද්‍යය. එහෙත් ක්‍රීඩා උළෙල හම්බන්තොටදී පැවැත්වීමට කළ සැලසුම එතරම් සුබදායක නොවේ. ක්‍රීඩා උළෙලට අවශ්‍ය ක්‍රීඩාපිටි, පිහිණුම් තටාක, ගෘහස්ත ක්‍රීඩංගන, පාපන්දු පිටි, නේවාසිකාගාර පුහුණු මධ්‍යස්ථාන, මාධ්‍යවේදී පහසුකම්, ප්‍රේක්ෂකාගාර පහසුකම් ඇතිකරලීමට ශ්‍රීලංකාවට හැකිවේදැයි සෙසු ලෝකයා කල්පනාකරනු ඇත.

ජාත්‍යන්තර ක්‍රීඩා තරඟයක් පැවැත්වීමට තරම් සංවිධාන ශක්තියක් සැබැවින්ම ශ්‍රී ලංකාවට තිබේ. 1976 දී නොබැඳි සමුළුව, 1974 සහ 1998 දී පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සම්මේලනය, වරින්වර සාක් සමුළුව, සාප් ක්‍රීඩා උළෙල, ලෝක බිලියඩ් ශූරතාව, ලෝක ක්‍රිකට් ශූරතාව පවත්වා ඇත. ශ්‍රීලංකාවට පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩාතරඟ පැවැත්වීමට අවශ්‍ය සංවිධාන ශක්තිය හා නිර්මාණශීලිත්වය කදිමට තිබේ. එහෙත් මූල්‍ය අයෝජන හා ආර්ථික පසුබිම් පිළිබඳව මීට වඩා සැලකිලි මත්විය යුතුයි සිතමි.

1996 ග්‍රීසියේ ඇතැන්ස් නුවර පැවති ඔලිම්පික් උළෙලට වැයවූ මුදල් කන්දරාව නිසා අදත් ග්‍රීසිය ආර්ථික වශයෙන් බංකොලොත්ව පවතී නවදිල්ලි නුවරදී පැවති පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා තරඟ නිසා ඉන්දියාවට එල්ලවූ අපවාද සහ අවලාද අදටත් එහෙමය. යටිතල පහසුකම් ගොඩනැංවීම මෙන්ම සංවිධාන ජාලාවේ මූල්‍ය (මුදල්) හා ගිණුම්වල අවුල් වියවුල් තවමත් අවසන් නැත. ලෝක ක්‍රිකට් ශූරතාවේ සත්කාරක රටක් වූ ශ්‍රීලංකාවට ද එවැනි චෝදනා එල්ලවී තිබේ.